# බී චමාලි එ. ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය, පානදුර

RTIC Appeal (පෞද්ගලික විභාග කිරීම)/198/2017 - 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන් හි (ගාස්තු සහ අභියාචනා කාර්යයපටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යයපටිපාටිය -

මෙම අභියාචනා විභාගය 2018.04.20 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදී.

**සභාපති -** මහින්ද ගම්මන්පිල
**කොමිෂන් සභා සාමාජික -** ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සාමාජික -** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සාමාජික -** ආචාර්ය සෙලවී තිරුචන්ද්‍රන්
**කොමිෂන් සභා සාමාජික -** විනිසුරු රෝහිනී වල්ගම

**අධ්‍යක්ෂ ජනරාල් -** පියතිස්ස රණසිංහ

**අභියාචක -** බී චමාලි
**නොතීසි ලත් පාර්ශව -** නම්කළ නිලධාරී, ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය, පානදුර

**පෙනීසිටීම**
**අභියාචක -** බී චමාලි
ආර් ස්ටැන්ලි
**පොදු අධිකාරිය -** ඩබ්ලිව් එම් සුනේත්‍රා ගීතාංජලී, සහාකාර අධ්‍යක්ෂ - සැලසුම්, ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය, පානදුර

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය: | 2017.06.27 |
| තොරතුරු නිලධාරියා තීරණය ලබා දුන් දිනය: | - |
| නම්කළ නිලධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය: | 2017.09.26 |
| නම්කළ නිලධාරියා තීරණය ලබා දුන් දිනය: | - |
| RTIC කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කළ දිනය: | 2017.09.27 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**
අභියාචක, 2017.06.27 දින ලිපියක් මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා සිටින ලදී.

1. 2009.03.12 දින ග්‍රාම නිලධාරී විමලරත්න මහතා වෙද මාවතේ ගල්තුඩේ පිහිටි තුඩුවවත්ත ඉඩමේ අනවසර ඉදිකිරීම සහ ගොඩකිරීම් කරන බවට ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයට ඉදිරිපත් කළ සියලුම ලේඛන
2. 2011.08.17 දින ප්‍රාදේශීය මහාලේකම් චම්පා පෙරේරා මහත්මිය පරිසර අධිකාරියට යවන ලිපියේ තුඩුවත්ත පොල් ඉඩම කුඹුරු ඉඩමක් බවට සඳහන් කර ඇත්තේ මොන පදනමක් මතද යන්න
3. 2017.03.23 දින ඉඩම් නිලධාරී ඉන්ද්‍රානි ජයසේකර මහත්මියගේ නිරීක්ෂණ වාර්තාවේ පිටපතක්

තොරතුරු නිලධාරී තම තොරතුරු ඉල්ලීමට පිළිතුරු නොසැපයූ හෙයින් අභියාචක 2017.09.26 දින නම්කළ නිලධාරී හට අභියාචනයක් යොමු කරන ලදී. අභියාචක නම්කළ නිලධාරී හමුවීමට ගිය අවස්ථාවේදී, මෙම පනත යටතේ අභියාචකට තොරතුරු සැපයීමට තමා බැඳී නොමැති බවට නම්කළ

නිලධාරී අභියාචකට පවසා ඇත. මෙයින් සෑහීමකට පත් නොවූ අභියාචක 2017.09.27 දින කොමිෂන් සභාවට අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනා අවස්ථාවේ උද්ගත වූ කාරණා:**
අභියාචක සමග පැමිණ කරුණු ඉදිරිපත් කර ආර් ස්ටැන්ලි මහතා පවසා සිටියේ ඔහු සහ ඕස්ට්‍රේලියාවේ වාසය කරන අභියාචක වෙත ඇටෝර්නි බලය ලබාදී ඇති කාන්තාව ගොල්ෆ් පිටියක් තැනීමේ අදහසින් දූපතක් මිළදී ගත් බවයි. මෙම දූපතට ඇති එකම ප්‍රවේශ මාර්ගයෙන් වන ගං ඉවුර ඔස්සේ ඇති රක්ෂිත ප්‍රදේශයේ මාර්ගයක් භාවිත කිරීමට නොදී ප්‍රාදේශීය ලේකම් ඇතුලු ප්‍රදේශයේ සිටින මැර පිරිස් අවහිරතා දක්වන බවද පවසා සිටින ලදී. ග්‍රාම නිලධාරී විමලරත්න මහතා වෙද මාවතේ ගල්තුඩේ පිහිටි තුඩුවවත්ත ඉඩමේ අනවසර ඉදිකිරීම සහ ගොඩකිරීම් කරන බවට ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයට ලේඛන ඉදිරිපත් කිරීම සහ ප්‍රාදේශීය මහාලේකම් චම්පා පෙරේරා මහත්මිය පරිසර අධිකාරියට එම තුඩුවත්ත පොල් ඉඩම කුඹුරු ඉඩමක් බවට සඳහන් කර ලිපි ලිවීම යනාදී කටයුතු සිදු කරමින් අභියාචකට විවිධ අවහිරතා ඇති කරන ලදී. අභියාචක පවසා සිටියේ මෙම ඉඩම කුඹුරු ඉඩමක් නොවන බවත් මෙය අක්කරයක පමණ පොල් ඉඩමක් වන බවත් මෙම ප්‍රවේශ වීමේ මාර්ගය නීත්‍යානුකූලව අභියාචක නියෝජනය කරන පාර්ශවය වෙනුවෙන් ලබා දිය යුතු බවත්ය.

2009 වර්ෂයේ සිට කිහිප වතාවක්ම අභියාචක ඇතුළු පිරිස මෙම ගඟ ආශ්‍රිත රක්ෂිත ප්‍රදේශයේ මාර්ග සීමා ලකුණු කිරීමට තැත් කළද ඒ සෑම අවස්ථාවකදීම මැර පිරිස් පැමිණ ප්‍රාදේශීය ලේකම් වෙත පැමිණිලි ඉදිරිපත් කරන බවද පවසා සිටින ලදී.

පොදු අධිකාරිය විසින් තොරතුරු ඉල්ලීමට ප්‍රතිචාර දක්වා නොමැත්තේ මන්ද යයි විමසා සිටි අවස්ථාවේ පොදු අධිකාරිය පවසා සිටියේ මේ පිළිබඳව විස්තර සොයා බලා සම්පූර්ණ පිළිතුරක් ලැබෙන තුරු සිටි බවත් එයට කාලය ගතවන බවත්ය. මෙවිට පොදු අධිකාරියට පනත ප්‍රකාරව කල් ඉල්ලමින් අභියාචක වෙත පිළිතුරක් සැපයීමට අවස්ථාව ඇති බව අවධාරණය කර සිටින ලදී. ඉල්ලා ඇති තොරතුරු අයිතම තුනෙන් කවර තොරතුරු පොදු අධිකාරිය සතුව තිබෙන්නේදැයි විමසා සිටියදී පවසා සිටියේ අයිතම 3හි සඳහන් ඉන්ද්‍රානි ජයසේකර මහත්මියගේ නිරීක්ෂණ වාර්තාව ලබා දිය හැකි බවයි.

අයිතම අංක 1 සහ 2 ට අදාලව ලිපිගොනු පැරණි බැවින් එම ලේඛන ලබා දිය නොහැකි බවත් මේ සම්බන්ධ නව ලේඛන ලබා දීමේ හැකියාවක් ඇති බවත් පවසා සිටින ලදී. පොදු අධිකාරියක් විසින් එම අධිකාරිය සතුව යම් තොරතුරක් නොමැති බව ප්‍රකාශ කර සිටියද එම තොරතුරු තිබෙන බවට ප්‍රබල සාක්ෂියක් තිබෙන අවස්ථාවක පොදු අධිකාරියෙහි ගොනු පරීක්ෂා කිරීම සඳහා පනත ප්‍රකාරව කොමිෂන් සභව වෙත බලතල ලබා දී ඇති බව පොදු අධිකාරියෙහි අවධානයට යොමු කරන ලදී.

මෙම අවස්ථාවේදී, මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් ඉඩමට ආසන්නයේ පිහිටි තොටුපල සහ ආසන්න ප්‍රදේශයේ බොල්ගොඩ ගඟ රක්ෂිතය සලකුණු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට 2017.09.27 දිනැති ලිපිය මඟින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇති අතර ලිපිය සහ එම ලිපියට අනුව අභියාචකගේ ඉඩමට ආසන්නව පිහිටි තොටුපල සහ ආසන්න ප්‍රදේශයේ බොල්ගොඩ ගඟ රක්ෂිතය සලකුණු (ගඟ රක්ෂිතයේ අඩි 40 සීමාව මැන ගැනීමට) කිරීමට සකසන ලද, කළුතර මැනුම් අධිකාරී කාර්යාලය වෙත යවන ලද 2017.11.29 දිනැති මැනුම් ඉල්ලීම් ලිපියේ පිටපතක් අභියාචකට ලබා දෙන ලදී. අභියාචක පවසා සිටියේ මෙම මෙම සිදුවීම් වලින් අනතුරුව මිනුම් නියෝගයක් ලබා දුන්නද එය ක්‍රියාත්මක කිරීමට ඉඩ ලබා දී නොමැති බවයි.

අභියාචනය අවස්ථාවේදී ඉන්ද්‍රනී ජයසේකර මහත්මිය විසින් සිදු කරන ලද පරීක්ෂනය සිදු කිරීමට හේතු අභියාචක පොදු අධිකාරියෙන් විමසා සිටින ලදී. එවිට පොදු අධිකාරිය විසින් පවසා සිටියේ තෙවන පාර්ශවයක් විසින් පෙත්සමක් යොමු කොට තිබූ බැවින් පරීක්ෂනය සිදුකළ බවයි. මෙම පෙත්සම කොමිෂන් සභාවේ පරීක්ෂාව සඳහා ලබා දෙන ලදී.

අභියාචක නැවතත් මෙම මැනුම් නියෝගය නතර කිරීම සම්බන්ධයෙන් පවසා සිටියදී පොදු අධිකාරිය පවසා සිටියේ මෙය නතර කර නොමැති බවයි. එනමුත් කරුණු අනුව පෙනී යන්නේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් පොදු අධිකාරියෙහි ඉඩම් අංශයේ ඉල්ලීමක් මත මෙම මැනීම තාවකාලිකව නතර කර ඇති බවයි. මෙය පිළිබඳ සොයා බලා නැවත කරුණු වාර්තා කිරීමට මාසයක කාලයක් පොදු අධිකාරිය ඉල්ලා සිටින ලදී.

**නියෝගය:**
කොමිෂන් සභාවට පනතේ 15 (ඇ) වගන්තිය ප්‍රකාරව 'මේ පනතේ විධිවිධාන යටතේ වූ යම් පොදු අධිකාරියක් විසින් ප්‍රතික්ෂේප කරනු ලබන තොරතුරු ඇතුළුව පොදු අධිකාරියක් විසින් දරනු ලබන තොරතුරු පරීක්ෂා කිරීම' ට බලතල ඇති බවට පොදු අධිකාරියෙහි අවධානය යොමු කරමින් ස්ථිර වශයෙන්ම මෙම ලේඛන තම සන්තකයේ, භාරයේ හෝ පාලනයේ නොමැතිනම් ඒ බව වගකීමකින් යුතු ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා පනතේ 15 (ආ) වගන්තිය ප්‍රකාරව දිව්රුම්දීමක් හෝ ප්‍රතිඥාදීමක් යටතේ යම් තැනැත්තකු විභාග කිරීමට බලතල ඇති බවටද අවධාරනය කර සිටින ලදී.
තවද පොදු අධිකාරිය වෙනුවෙන් කොමිෂන් සභාව ඉදිරියේ කරුණු කියාපෑම් සිදු කරන නිලධාරීන් සහ පොදු අධිකාරියෙහි ඉඩම් අංශයේ නිලධාරීන් මෙම කරුණ සම්බන්ධයෙන් දරණ මතයන්/ සිටින ස්ථාවරයන් පරස්පර විරෝධී බව නිරීක්ෂනය කර සිටිමු. මීළඟ කැඳවීම් දිනට පෙර මේ සම්බන්ධව සොයා බල පැහැදිලි පිළිතුරක් ලබා දෙන ලෙසට නියෝග කර සිටිමු.
අභියාචනය කල් තබන ලදී.
මීළඟ කැඳවීම් දිනය: 2018.06.14
****
RTIC Appeal (පෞද්ගලික විභාග කිරීම)/198/2017 - 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන් හි (ගාස්තු සහ අභියාචනා කාර්යයපටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යයපටිපාටිය -
මෙම අභියාචනා විභාගය 2018.06.14 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදී.

**සභාපති -** මහින්ද ගම්මන්පිල
**කොමිෂන් සභා සාමාජික -** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සාමාජික -** ආචාර්ය සෙලවී තිරුචන්ද්‍රන්
**කොමිෂන් සභා සාමාජික -** විනිසුරු රෝහිනී වල්ගම

**අධ්‍යක්ෂ ජනරාල් -** පියතිස්ස රණසිංහ

**පෙනීසිටීම**
**අභියාචක -** බී චමාලි
ආර් ස්ටැන්ලි
**පොදු අධිකාරිය -** ඩබ්ලිව් එම් සුනේත්‍රා ගීතාංජලී, සහාකාර අධ්‍යක්ෂ - සැලසුම්, ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය, පානදුර
ඒ අයි ජයසේකර, ඉඩම් නිලධාරී, ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය, පානදුර

**අභියාචනා අවස්ථාවේ උද්ගත වූ කාරණා:**
තම ඉඩම මැනුම් කිරීම වර්ෂ 9 ක කාලයක සිට පොදු අධිකාරිය වුවමනාවෙන් කල් අරින බවට අභියාචක විසින් පවසන ලදී.

2017.09.27 දිනැති ලිපිය මඟින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් උක්ත ඉඩමට ආසන්නයේ පිහිටි තොටුපල සහ ආසන්න ප්‍රදේශයේ බොල්ගොඩ ගඟ රක්ෂිතය සලකුණු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසත්, එසේ කිරීමෙන් අනතුරුව රක්ෂිතය ඔස්සේ මාර්ගයක් සකස් කර ගැනීමට කර ඇති ඉල්ලීම කළුතර දිස්ත්‍රික් පරිසර කමිටුව විසින් පරීක්ෂා කර බලා තීරණය කළ යුතු බවට පොදු අධිකාරියට දන්වා එවා ඇතත්, මෙම ඉඩම සම්බන්ධයෙන් සිවිල් අභියාචනා මහා අධිකරණයේ නඩුවක් පවතින බවට විරෝධතා ඉදිරිපත් වූ හෙයින් මැනුම් කටයුතු අත්හිටුවන ලෙසට පීඑන්/එල්/1/68 දරණ හා 2018.02.02 ලිපිය මඟින් පොදු අධිකාරිය අභියාචකට පිටපතක් සහිතව මැනුම් අධිකාරියට දන්වා ඒවා ඇති බවට සඳහන් කර සිටින ලදී.
මේ හේතුවෙන් ඉඩම් මැනුම් කිරීමට හෝ එයට අදාලව කිසියම් කටයුත්තක් සිදු කිරීමට අවසර දීමට පොදු අධිකාරියට බලයක් නොමැති බවට පොදු අධිකාරිය කොමිෂන් සභාවට තව දුරටත් පවසා සිටින ලදී.
අභියාචනය කල් තබන ලදී.
මීළඟ කැඳවීම් දිනය: 2018.08.07
*****

RTIC Appeal (පෞද්ගලික විභාග කිරීම)/198/2017 - 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන් හි (ගාස්තු සහ අභියාචනා කාර්යයපටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යයපටිපාටිය -
මෙම අභියාචනා විභාගය 2018.08.07 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදී.

**සභාපති** - මහින්ද ගම්මන්පිල
**කොමිෂන් සභා සාමාජික** - ජොෂ්ඨ නීතිඥ  කිශාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සාමාජික** - ජොෂ්ඨ නීතිඥ  එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සාමාජික** - ආචාර්ය සෙලවී තිරුචන්ද්‍රන්
**කොමිෂන් සභා සාමාජික** - විනිසුරු රෝහිනී වල්ගම

**අධ්‍යක්ෂ ජනරාල්** - පියතිස්ස රණසිංහ

**පෙනීසිටීම**
**අභියාචක** - බී චමාලි
ආර් ස්ටැන්ලි
**පොදු අධිකාරිය** -  කේ ටී කේ සුලොචනී, සහකාර ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය, පානදුර

**අභියාචනා අවස්ථාවේ උද්ගත වූ කාරණා:**
උක්ත ඉඩමට අදාලව කරුණු සාකච්ඡා කිරීමක් ප්‍රාදේශීය මහලේකම් සහ අභියාචකගේ සහභාගීත්වයෙන් සිදුවූ බවට පොදු අධිකාරිය කොමිෂන් සභාව දැනුවත් කරන ලදී. ඒ අනුව ඉඩම සම්බන්ධයෙන් සිවිල් අභියාචනා මහා අධිකරණයේ නඩුවක් පවතින හෙයින් ඉඩම මැනුම් කිරීමට නොහැකි අතර, ගඟ සීමාව පමණක් ලකුණු කිරීමට දෙපාර්ශවයම තීරණයකට එළැඹි බවට පොදු අධිකාරිය කොමිෂන් සභාවට දැනුම් දෙන ලදී.

**නියෝගය:**
තොරතුරු ඉල්ලීමේ පොදු අධිකාරිය සතු වූ තොරතුර වන අයිතම අංක 3 ට අදාල නිරීක්ෂණ වාර්තාව අභියාචකට ලබා දී ඇති හෙයින් සහ මෙම මැනුම් කිරීම සම්බන්ධව පාර්ශව දෙකම සමතයකට පැමිණීමට තීරණයකට එළැඹි හෙයින් අභියාචනය මෙසේ අවසන් කරන ලදී.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ 27(3) වගන්තියේ කොමිෂන් සභා රීතීන් ට (ගාස්තු සහ අභියාචනා කාර්යයපටිපාටිය), අනුව මෙම නියෝගය අභියාචනය පාර්ශවකරුවන් හට ලබා දීමට කටයුතු කරන මෙන් නියෝග කර සිටිමු.
****

..............................................................
මහින්ද ගම්මන්පිල - සභාපති

..............................................................
ජොෂ්ඨ නීතීඥ  කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමිෂන් සභා සාමාජික

...............................................................
ජොෂ්ඨ නීතීඥ  එස්. ජී. පුංචිහේවා - කොමිෂන් සභා සාමාජික

...............................................................
ආචාර්ය සෙලවී තිරුචන්ද්‍රන් - කොමිෂන් සභා සාමාජික

..............................................................
විනිසුරු රෝහිනී වල්ගම - කොමිෂන් සභා සාමාජික